# දේශීය යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයන්ට අත්වැලක් - කර්මාන්තකරුවන්ට පහසුවක්

ටී.සී. පීරිස්
සහකාර අධ්‍යක්ෂ
කාර්මික තොරතුරු අංශය

ශිෂ්ඨාචාරයේ දියුණුවත් සමඟම ක්‍රමානුකූලව මිනිස් අවශ්‍යතා බහුල විය. මෙම අසීමිත අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා විවිධ යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනයට මිනිසුන් පෙළඹුණි. ඒ අනුව කර්මාන්තශාලාවේදී, කාර්යාලයේදී මෙන්ම නිවසේ කෙරෙන විවිධ කටයුතු පහසුවෙන් හා ඉතා කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා වර්තමානයේ අත් යන්ත්‍ර, අර්ධ ස්වයංක්‍රිය සහ ස්වයංක්‍රිය වශයෙන් විවිධ යන්ත්‍ර සූත්‍ර භාවිත කෙරේ.

කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන බොහෝ දෙනෙක් විදේශීය යන්ත්‍ර සූත්‍ර, භාවිතයට කැමැත්තක් දක්වන බව බොහෝ අවස්ථාවලදී පෙනී ගොස් ඇත. නමුත් ආනයනික යන්ත්‍ර වල ඇතිවන විවිධ දෝෂ නිරාකරණය කිරීමේදී හා අළුත්වැඩියා කටයුතු කිරීමේදී එම යන්ත්‍රවල සංකීර්ණ තත්ත්වය නිසා විවිධ ප්‍රශ්නවලට මුහුණපෑමට සිදුවේ. නමුත් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යන්ත්‍රසූත්‍ර සඳහා අපේම දේශීය තාක්ෂණය යොදා ගන්නා බැවින්, ඒවා දේශීය නිෂ්පාදකයන් සඳහා වඩාත්ම සුදුසු අතර, ඉතාමත් සරලව හා අවශ්‍යතාවය අනුව නිෂ්පාදනය කර ඇත.

එමෙන්ම අවශ්‍යතාවය අනුව යන්ත්‍ර නිෂ්පාදනය කරවා ගැනීමේ හැකියාවද ඇත. එබැවින් එහි ක්‍රියාකාරීත්වය මෙන්ම නඩත්තු කටයුතු කිරීමද පහසුවේ. එමෙන්ම දැරිය හැකි මිලකට ලබා ගැනීමේ පහසුවද ඇත. දේශීය යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම නිසා ආනයනික යන්ත්‍ර සූත්‍ර සඳහා වැයවන විදේශ විනිමය ඉතිරියක් පමණක් නොව ඒ සඳහා දේශීය ශ්‍රමය යොදා ගැනීමෙන් වක්‍ර රැකියා උත්පාදනයක්ද ඇතිවේ.

මේ අනුව දේශීය යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයන් යන්ත්‍ර භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන්ට හා ධාරිතාවයන්ට ගැලපෙන යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කළ යුතුව ඇති අතර, කර්මාන්තකරුවන් හැකිතාක් දේශීය යන්ත්‍රසූත්‍ර භාවිතය සඳහා උනන්දු කළ යුතුව ඇත. උදාහරණයක් වශයෙන් තල කැරලි නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පිළිබඳ විමසමින් බොහෝ කර්මාන්තකරුවන් අප ආයතනයට පැමිණේ. (මෙයට හේතුව දැනට වෙළෙඳපොළේ තල කැරලි සඳහා විශාල ඉල්ලුමක් පැවතීමයි ) නමුත් දැනට ඔවුන් සාම්ප්‍රදායිකව නිෂ්පාදනය කළත් අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර නොමැතිකම ප්‍රධාන ප්‍රශ්නයක් වී ඇත. ඒ අනුව යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනයේදී කර්මාන්තකරුවාගේ යන්ත්‍ර සූත්‍ර අවශ්‍යතාවය කුමක්ද? ධාරිතාවය කොපමණද? ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකි කුමන ආයතනවලින්ද යන්න පිළිබඳව යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයන් උනන්දු විය යුතුය.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය දේශීය යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහාත් අංශය වෙත පැමිණෙන කර්මාන්තකරුවන්ට යන්ත්‍රසූත්‍ර ලබා ගත හැකි ආයතන පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහාත් කාලයක් තිස්සේ ඉතාමත් අනගි සේවාවක් ඉටු කරනු ලබයි. එනම් ඔවුනොවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගත් කාර්මික තාක්ෂණවේදී තොරතුරු සේවා මධ්‍යස්ථානය දැනටමත් දේශීය යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදකයින් සහ යන්ත්‍රසූත්‍ර තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණයකර පවත්වාගෙන යයි.

මෙම දත්ත පද්ධතියෙහි දේශීය නිෂ්පාදකයන්ගේ තොරතුරු ලැබෙන පරිදි පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ඇතුළත්කර ඇත.

- යන්ත්‍රයේ නම
- භාවිතය
- ධාරිතාව
- මිල
- නිෂ්පාදිත ආයතනයේ නම සහ ලිපිනය
- දුරකථන,ෆැක්ස්, විද්‍යුත් ලිපිනය හා වෙබ් ලිපිනය

එම දත්ත පද්ධතියෙහි ඇතුළත් තොරතුරු පදනම් කරගෙන අප වෙත ලැබෙන විමසුම් සඳහා පිළිතුරු ලබාදෙන අතර, එමගින් කර්මාන්තකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකිවේ.

මේ දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කරගැනීම සඳහා යම් නිෂ්පාදකයෙක් / යන්ත්‍රසූත්‍ර සැපයුම්කරුවෙක් කැමැත්තක් දක්වන්නේ නම්, ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යාල මඟින් ලබා ගැනීමට හැකිවේ.

එමෙන්ම යන්ත්‍රසූත්‍ර පිළිබඳ තොරතුරු අපගෙන් විමසීමෙන් අවශ්‍ය අය වෙත ලබා දීම සඳහා ඉඩකඩ සලසා ඇත.

කාර්මික තාක්ෂණවේදී තොරතුරු සේවා අංශයේ අධ්‍යක්ෂ ඇමතීමෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගත හැකිය.